# අලෙවියෙන් පසු සුවිශේෂී ප්‍රතිලාභ අත්විඳින්නට STERLING AFTERCARE GUARANTEE සහතිකලත් වාහනයක සාඩම්බර හිමිකරුවෙක් වන්න

**දශකයකට ආසන්න කාලයක් පුරා වාහන සේවා සැපයුම් ක්ෂෙත්‍රය හා බැඳී කීර්තිමත් නාමයක් ලෙස ස්ටර්ලින් ඔටෝමොබයිල්ස් ලංකා (පුද්) සමාගම හැඳින්විය හැක. ජපන් වාහන සඳහා ප්‍රථම වරට Sterling Aftercare Guarantee වගකීම් සහතිකය පිරිනැමූ ස්ටර්ලින් ඔටෝමොබයිල්ස් ලංකා (පුද්) සමාගම ඉන් නොනැවතී ස්ටර්ලින් Aftercare වගකීම් සහතිකය ලද වාහන හිමිකරුවන් සඳහා අලෙවියෙන් පසු සුවිශේෂී ප්‍රතිලාභ හිමිකර දෙන්නට ක්‍රියා කරයි. ඒ පිළිබඳව උඩහමුල්ල - නුගේගොඩ Sterling Aftercare Centre හි නියෝජිතයෙක් සමඟ කළ සාකච්ඡාවක් පහතින් දිග හැරේ.**



- **Sterling Aftercare Guarantee සහතිකය පිළිබඳ හැඳින්වීමක් සිදු කළොත්...,**

පෙරදී මෙරටට ජපන් වාහන ආනයනය කිරීමේදී පාරිභෝගිකයන් ඉමහත් දුෂ්කරතාවන්ට පත් වුණා. විශේෂයෙන්ම වාහනයේ ඡායාරූපය පමණක් නිරීක්ෂණය කර වාහන මෙරටට ගෙන්වන අවස්ථාවලදී ඡායාරූපයේ තිබූ තත්ත්වයෙන් වාහනය නොතිබීම, වාහන ආනයනය කරන නියෝජිතයන් වගකීමෙන් නිදහස් වීම ආදී ගැටලුකාරී අවස්ථා ඇති විය. මෙවැනි ගැටලු සලකා බලා Sterling Automobiles Lanka ආයතනය ලංකාවට ගෙන්වන ජපන් වාහන සඳහා ප්‍රථම වරට වගකීම් සහතික නිකුත් කිරීමේ සංකල්පය ඇති කිරීමට පියවර ගත්තා. ඉන් නොනැවතී හයිබ්‍රිඩ් වාහන මෙරටට ගෙන්වන පළමු අවස්ථාවේදී ද ඒ සඳහා වගකීම් සහතික පිරිනැමීමේ භාරධූර වගකීම ආරම්භ කරනු ලැබුවේ Sterling Automobiles Lanka ආයතනයයි.

ස්ටර්ලින් ඔටෝ මොබයිල්ස් ලංකා (පුද්) සමාගමේ මවු ශාඛාව ජපානයේ පිහිටා තිබෙනවා. Toyota, Honda, Suzuki, Mazda ආදී වූ ඕනෑම ජපානයේ නිෂ්පාදිත වාහනයක එන්ජින්, ගියර් බොක්ස් වැනි අංග පරීක්ෂා කර එම වාහන සන්නාමයන් සඳහා යම්කිසි කාලසීමාවකට බලපැවැත්වෙන පරිදි වගකීම් සහතික අප මවු සමාගම පිරිනමනවා. උදාහරණ වශයෙන් සඳහන් කරනවා නම් වාහන එන්ජින් සහ ගියර් බොක්ස් සඳහා වසර 02ක වගකීම් කාලයක් අපි පිරිනමනවා. හයිබ්‍රිඩ් වාහනවල හයිබ්‍රිඩ් බැටරිය සඳහා වසර 03ක වගකීම් කාලයක් පිරිනමනවා. එලෙස පාරිභෝගිකයින් විසින් ඉල්ලුම් කරන වාහනය සඳහා වගකීම් සහතික නිර්දේශ කිරීමෙන් අනතුරුව මෙරට වාහන ගෙන්වා බෙදා හරින ආයතන වෙත වාහන නිකුත් කෙරෙනවා. එලෙස පාරිභෝගික ඔබට Sterling Aftercare Guarantee සහතිකය ලැබූ ජපන් වාහන මිලදී ගැනීමේ හැකියාව පවතිනවා.

ස්ටර්ලින් Aftercare වගකීම් සහතිකය ලැබූ වාහන සඳහා අදාළ වගකීම් කාල සීමාව තුළ සියලුම සේවාවන් පිරිනැමීමේ වගකීම දරන්නේ Sterling Automobiles Lanka ආයතනයයි. දිවයින පුරා පිහිටා ඇති ස්ටර්ලින් Aftercare Centre ඔස්සේ ඔබ මිලදී ගන්නා ලද ස්ටර්ලින් Aftercare වගකීම් සහතිකය ලද වාහනයේ ඕනෑම ආකාරයක අලුත්වැඩියා කටයුත්තක් හෝ Service කිරීම් සිදු කර ගැනීමේ පහසුව සලසා තිබෙනවා. ඊට අවැසි නවීන ජපන් තාක්ෂණය අප සමාගම සතුව තිබෙනවා.

- **Sterling Aftercare Guarantee සහතිකය ලද වාහනයක හිමිකරුවෙකු වීමෙන් පාරිභෝගිකයින්ට අත්විඳිය හැකි සුවිශේෂී ප්‍රතිලාභ මොනවාද?**

ස්ටර්ලින් Aftercare වගකීම් සහතිකය ලැබූ වාහනයක් මිලට ගන්නා පාරිභෝගිකයන්හට සෑම අතින්ම වාසි සහගත අවස්ථා හිමි වෙනවා. ජපන් වාහනයකට අලෙවියෙන් පසු ලබා දිය යුතු කඩිනම් සේවාව අප

පාරිභෝගිකයින්ට ලබා දීමට ඇප කැප වී සිටිනවා.

ඔබ මිලදී ගන්නා ජපන් වාහනයේ මතුවන ගැටලු සම්බන්ධයෙන් අප සමාගම ඕනෑම වේලාවක ඔබට සහය ලබා දීම සඳහා Roadside Assistance Service නම් සේවාවක් ක්‍රියාත්මක කරනවා. හදිසියේ වාහනයේ ක්‍රියාකාරීත්වය අඩපණ වූ විටකදී වුවද පැය 24 පුරා ක්‍රියාත්මක Roadside Assistance Service ඇමතීමෙන් ඔබට අවශ්‍ය උපදෙස් හෝ සේවා ලබා ගත හැකියි.



කිසියම් ජපන් වාහනයක් සඳහා හිමිවන ස්ටර්ලින් Aftercare වගකීම් කාලසීමාව ඇතුළත වැඩ කුලී රහිත Service අවස්ථාවන් 05ක් පාරිභෝගිකයින් වෙත අප ආයතනය පිරිනමනවා. එම සේවා වාර 05 අපගේ ඕනෑම ශාඛාවකින් ලබා ගැනීමට පුළුවන්. එහිදී පාරිභෝගිකයාට වියදම් දැරීමට සිදු වන්නේ වාහනය සඳහා යොදන තෙල් වර්ග සඳහා පමණි. ඒ වගේම වගකීම් කාලය ඇතුළදී ස්ටර්ලින් Aftercare වගකීම් සහතික නිකුත් කරන ඔබගේ වාහනයේ උපාංග අලුත්වැඩියා කිරීම හෝ නැවත එක් කිරීම (Replace) ද අප සිදු කරනවා. නමුත් එහිදී වාහනයේ හිමිකරු නිවැරදි ලෙස වාහනය පරිහරණය කර තිබීම අත්‍යවශ්‍ය කොන්දේසියක් ලෙස සලකනවා.

ස්ටර්ලින් Aftercare වගකීම් කාලය ඉක්ම ගිය පසුව වුවද අප ආයතනය සමඟ දීර්ඝ කාලයක් රැඳී සිටින පාරිභෝගිකයන් හට දසවන සේවා වාරය නොමිලේ පිරිනැමීමට අප ආයතනය කටයුතු කරනවා. ඊට අමතරව අප සමඟ රැඳෙන ගනුදෙනුකාර භවතුන් සඳහා විශේෂ වට්ටම්, සේවා වාර සඳහා එක් කිරීමට ද කටයුතු කරනවා.

- **Sterling Aftercare Centre හි තාක්ෂණය පිළිබඳව සඳහන් කළොත්,**

අප සමාගම සතු තාක්ෂණය පිළිබඳ සඳහන් කරනවා නම් දැනට ලංකාවේ වාහන Service කිරීම හා අලුත්වැඩියාව සම්බන්ධ නවීනතම තාක්ෂණය සහ ඊට අවශ්‍ය හොඳම අමුද්‍රව්‍ය, උපාංග අප සතුයි. ස්ටර්ලින් Aftercare මධ්‍යස්ථානවල සේවයේ නියුතු සියලු තාක්ෂණික සහ කාර්මික ශිල්පීන් ජපන් තාක්ෂණික දැනුමින් සන්නද්ධයි. විශේෂයෙන්ම ඔවුන් ඒ සම්බන්ධ දැනුමෙන් සහ පළපුරුද්දෙන් සමන්විතයි. ජපන් තාක්ෂණික විශේෂඥයින්ගේ (Japanese Technical Experts) සහය නිරතුරුව අප සමාගම ලබා ගන්නේ

පාරිභෝගිකකයින්ට ගුණාත්මක, නවීන සහ යාවත්කාලීන වූ තාක්ෂණික සේවාවක් පිරිනැමීමේ අරමුණින්.

- **අනෙකුත් වාහන සඳහා පවතින සේවා මධ්‍යස්ථාන හා සසඳන විට ස්ටර්ලින් Aftercare Centre හි විශේෂත්වයන් මොනවාද?**

Sterling Aftercare Centre අපගේ වගකීම වන්නේ පාරිභෝගිකයින්ගේ වටිනා වාහනයට අවශ්‍ය සේවාවන් ගුණාත්මක අයුරින් පිරිනැමීමයි.

Sterling Aftercare Centre හි ක්‍රමානුකූල සැලසුම් සහගත බවකින් යුතුව ඔබේ වාහනයට අවශ්‍ය සේවාව ලබා දීමට කටයුතු කරනවා. ස්ටර්ලින් Aftercare වගකීම් සහතිකය ලැබූ වාහනයක් Service කිරීමට හෝ අලුත්වැඩියා කටයුත්තක් සඳහා අප මධ්‍යස්ථාන කරා රැගෙන යාමට බලාපොරොත්තුවනවා නම් පාරිභෝගිකයන් පළමුව සිදු කළ යුත්තේ අපගේ පාරිභෝගික සේවා කණ්ඩායම අමතා වාහනය අප පද්ධතියෙහි ලියාපදිංචි කිරීමයි. එහිදී ඔබට පැමිණීමට පහසු අපගේ සේවා මධ්‍යස්ථානය සඳහන් කර එහි වෙන් කර ගැනීමක් සිදු කළ යුතුයි. ස්ටර්ලින් Aftercare මධ්‍යස්ථාන මහර-කඩවත, උඩහමුල්ල - නුගේගොඩ, දූනගහ - මිනුවන්ගොඩ සහ ගාල්ල යන ප්‍රදේශයන්හි ස්ථාපිත කර තිබෙනවා. ඊට අමතරව ඔයිල් වර්ග හුවමාරු කිරීම සහ අමතර උපාංග සඳහාම විශේෂිත වූ ස්ටර්ලින් Aftercare මධ්‍යස්ථානයක් නාරාහේන්පිට පිහිටුවා තිබෙනවා.

අපගේ සේවා මධ්‍යස්ථාන වෙත පිවිසෙන පාරිභෝගිකයන් සඳහා සේවා උපදේශකවරුන් (Service Advisers) ඔස්සේ වාහනයට හිතකර සහ අහිතකර තත්ත්ව, වාහනයේ අමතර උපාංග, වාහනයේ නඩත්තුව, වාහන හිමිකරුවෙක් ලෙස ඔබ දැනගත යුතු අත්‍යවශ්‍ය කරුණු පිළිබඳව දැනුවත්භාවය ලබා දීමට අප කටයුතු සම්පාදනය කර තිබෙනවා. මෙහි පවතින විශේෂත්වය වන්නේ ඔබගේ වාහනය අපගේ සේවා ස්ථානයට ඇතුළත් කළ අවස්ථාවේ පටන් ඔබේ වාහනය සඳහාම විශේෂ වූ සේවා උපදේශකවරයෙක් වෙන්ව කටයුතු කිරීමයි.

ඒ වගේම වෙනත් සේවා මධ්‍යස්ථාන මෙන් නොව ස්ටර්ලින් Aftercare මධ්‍යස්ථාන තුළ වාහන හිමිකරුට වාහනය සම්බන්ධව සිදු කරන Service කිරීම් හෝ අලුත්වැඩියාව සම්බන්ධ කටයුතු නිරීක්ෂණය කිරීමට බාධාවක් නොමැති අතර ඊට අවශ්‍ය පහසුකම්ද මෙහි ස්ථාපිත කර තිබෙනවා. වාහන හිමිකරුට අවශ්‍ය පරිදි වැඩබිම වෙත පිවිස එහි ක්‍රියා පටිපාටිය නිරීක්ෂණය කළ හැකි වීම අප සතු විනිවිදභාවයෙන් යුතු සේවාව පිළිබඳ සාක්ෂි දරනවා.

තවත් සුවිශේෂී කාරණයක් සඳහන් කළ යුතුයි. ස්ටර්ලින් Aftercare සෑම මධ්‍යස්ථානයක් ඔස්සේම පරිසර හිතකාමී බවින් යුත් ගුණාත්මක සේවයක් පාරිභෝගික ඔබට සැලසීමට අප පියවර ගන්නවා. අපගේ මහර-කඩවත, දූනගහ - මිනුවන්ගොඩ සහ ගාල්ල යන ශාඛාවලට ISO - 9001 නිෂ්පාදන තත්ත්ව සහතිකය සහ ISO - 14001 පරිසර තත්ත්ව සහතිකය ලැබී තිබෙනවා. ඉදිරියේදී එම සහතික උඩහමුල්ල- නුගේගොඩ මධ්‍යස්ථානය වෙතද ලබා ගැනීමට අපේක්ෂිතයි.

- **ස්ටර්ලින් Aftercare ඕනෑම මධ්‍යස්ථානයකට පිවිසෙන පාරිභෝගිකයින්ගේ සුවපහසුව සඳහා සලසන සේවාවන් පිළිබඳව සඳහන් කරනවා නම්...,**

සාමාන්‍යයෙන් වාහනයක පූර්ණ සේවා කටයුත්තක් සඳහා පැය 4 - 5 ක කාලයක් සේවා මධ්‍යස්ථානය තුළ ගෙවා දැමීමට පාරිභෝගිකයාට සිදු වෙනවා. එහිදී පාරිභෝගිකයාට අවශ්‍ය සියලු පහසුකම්වලින් සමන්විත Customer Lobby අපගේ සෑම සේවා මධ්‍යස්ථානයකම ඉදිකර තිබෙනවා. එහිදී අන්තර්ජාල පහසුකම්, රූපවාහිනී නැරඹීමේ හැකියාව, තේ, කෝපි වැනි පාන ලබා ගැනීමේ හැකියාව වැනි පහසුකම් අප සපයා තිබෙනවා.

පාරිභෝගිකයන් සඳහා උපරිම පහසුව සහ නිදහස් සාමකාමී වටපිටාවක් සපයා දීම Customer Lobby හි අරමුණයි. තවදුරටත් මේ පහසුකම් වර්ධනය කිරීමට අප ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා.

දිවයින පුරා පිළිගත් වාහන ආනයනයකරුවන් 150/200 ප්‍රමාණයකින් පාරිභෝගික ඔබට ස්ටර්ලින් Aftercare වගකීම් සහතිකය ලද වාහන මිලදී ගැනීමට පුළුවන්. ඒ සම්බන්ධ සියලුම විස්තර සහ ස්ටර්ලින් Aftercare වගකීම් සහතිකය ලැබූ වාහන Service කිරීම හෝ අලුත්වැඩියාව සම්බන්ධව සියලු තොරතුරු 011 7600800 යන අපගේ පාරිභෝගික සේවා දුරකථන අංකය ඇමතීමෙන් ලබා ගත හැක.

**හෂිනි ඉරේෂා ගුණවර්ධන**






කොළඹ 2, හුණුපිටිය හරස් පාරේ අංක 8 දරන ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2018 මාර්තු මස 15 වැනිදා බ්‍රහස්පතින්දා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී